**ධීවර අමාත්‍යාංශය**
**ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය**
**(නාරා)**
**අභිලාෂය ප්‍රකාශ කිරීම (EOI)**

සමුද්‍රීය බහු මත්ස්‍ය විශේෂ (Multi-species) ජලජීවී වගාව සඳහා අභිජනනාගාරයක් ස්ථාපිත කිරීම, නඩත්තු කිරීම සහ ක්‍රියාත්මක කරවීම (සමෝධානික සමුද්‍රීය ජලජීවී වගාව සහ සංචාරක කර්මාන්තය සංවර්ධනය සඳහා විශේෂ අවධානය යොමු කරමින් ) - කල්පිටිය

කොන්ත්‍රාත් අංක : P&S/IARAD/2022/39/RL/TEN/15

ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (නාරා) ශ්‍රී ලංකාවේ ධීවර හා ජලජ සම්පත් සම්බන්ධයෙන් පර්යේෂණ හා සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ධීවර අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යනු ලබන ප්‍රධාන බලයලත් ආයතනය වේ.

ජලජීවී වගා ක්ෂේත්‍රය යනු රටක ආහාර සුරක්ෂිතතාවය, පෝෂණය, ජීවනෝපාය සංවර්ධනය සහ ආර්ථික වර්ධනය සඳහා විශාල දායකත්වයක් ලබා දිය හැකි ක්ෂේත්‍රයකි. මෙම කාර්යය ඉටු කර ගැනීමේ අරමුණින් පුත්තලම් දිස්ත්‍රික්කයේ කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුඩාව ප්‍රදේශයේ නාරා ආයතනය සතු (ලිපිනය: අංක. 629/C, කුඩාව, කන්දකුලිය උතුර) අක්කර තුනක (03) පමණ භූමි ප්‍රදේශයක්, සමුද්‍රික මත්ස්‍ය අභිජනනාගාරයක් ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම සඳහා ලබා දීමට නාරා ආයතනය කටයුතු සූදානම් කරමින් සිටියි.

මේ සඳහා මත්ස්‍ය පැටවුන් නිශ්පාදන අභිජනනාගාරයක් ආරම්භ කර, කරදිය/කිවුල්දිය ජලජීවී වගාව පවත්වාගෙන යා හැකි දැනට වාණිජ මට්ටමේ කරදිය/කිවුල්දිය පැටවුන් නිශ්පාදනය සහ ජලජ ජීවීන් වගා කිරීම කරනු ලබන විශ්වාසනීය පුද්ගලික ක්ෂේත්‍රයේ ආයතන සහ නියෝජිතයින්ගෙන් රාජ්‍ය පෞද්ගලික ව්‍යවසායකත්ව හවුල්කාරිත්වය (Public Private Partnership (PPP)) යටතේ පවත්වාගෙන යාම සඳහා දායකත්වය ලබා ගැනීමට අභිලාෂයන් කැඳවනු ලැබේ.

අභිලාෂයන් ප්‍රකාශ කිරීමේදී (EOI) පහත සඳහන් කරුණු සම්බන්ධව සවිස්තරාත්මක තොරතුරු අන්තර්ගත විය යුතුය.

අ). සමාගම පිළිබඳ පොදු තොරතුරු

ආ). නෛතික තත්වය

ඇ). ප්‍රාග්ධන වත්කම් ප්‍රමාණය හෝ ශුද්ධ වටිනාකම

ඈ). පසුගිය වසර තුන සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවල පිටපත්

ඉ). ජලජීවී වගාව පවත්වා ගෙන යාම පිළිබඳ පළපුරුද්ද

ඊ). කිසියම් අධිකරණයක සමාගමට එරෙහිව පවතින නඩු ක්‍රියාමාර්ග නොමැති වීම.

සුදුසු ආයතනයක් තෝරා ගැනීමේදී නාරා ආයතනය විසින් ලබාදෙනු ලබන භූමියෙහි අවශ්‍ය ගොඩනැගිලි සහ අනෙකුත් මූලික යටිතල පහසුකම් සපයා ගෙන සමුද්‍රීය අභිජනනාගාරයක් පවත්වා ගෙන යාමට බලාපොරොත්තු වන ආකාරය සහ පහත සඳහන් කරුණු පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

01). වාණිජමය ජලජීවී වගාව සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්ද

02 ). පහත සඳහන් කරදිය ජලජ විශේෂ අතුරින් අවම ලෙස විශේෂ දෙකක් හෝ ඊට වැඩි ගණනක් නිෂ්පාදනය කිරීම සඳහා යෝජිත අභිජනනාගාරයක් සැලසුම් කිරීමට, ඉදි කිරීමට සහ පවත්වාගෙන යාමට ඇති කැමැත්ත

i. කකුළුවන් (mud crab ( *Scylla serata*)) and blue swimming crab (*Portunus pelagieus*))
ii. මුහුදු කූඩැල්ලන් (Sand fish (*Holothuria scabra*))
iii. කාවාටි බෙල්ලන් (Oyster; (*Crassostrea* sp))
iv. දෙපියන් බෙල්ලන් (Green mussel ( *Perna viridis*))
v. කොස්සා (Grouper (*Ephinephalus* sp))
vi. මොදා (Sea bass (*Lates calcarifer*))
vii. වේක්කයා (Milk fish (*Chanos chanos*))
viii. මුහුදු පැළෑටි (Seaweeds (*Kappaphycus alvarezii*; *Eucheama cottonii*; *Gracilaria* sp))
ix. කරදිය විසිතුරු මසුන් (*Neocaridina sp* , *Amphiprion sp* , *Hippocampus sp*)

03). මේ පිළිබඳව සහයෝගීතාව/සබැඳියාව සහිතව නාරා ආයතනය සහ සමාගම අතර එළඹෙනු ලබන රාජ්‍ය පෞද්ගලික ව්‍යවසායකත්ව අන්‍යෝන්‍යාව ගිවිසුමකට/ එකඟතාවනට එළැඹීමට හා අත්සන් කිරීමට ඇති කැමැත්ත.

04). අභිජනනාගාරය ඉදි කිරීමට පෙර එහි භූමි සැලැස්ම සහ ඉදි කිරීම් කළමනාකරණ සැලැස්ම නාරා ආයතනය වෙත ලබා දීමට ඇති කැමැත්ත.

05). අභිජනනාගාරය, තවාන් (Nursery), වර්ධක පොකුණු සිමෙන්ති හෝ ෆයිබර් යොදා සැකසීම, ජීවී ආහාර වගාව සඳහා පහසුකම් ස්ථාපනය, අප ජලය පිරිසිදු කිරීමේ පහසුකම්, කරදිය සහ මිරිදිය ජලය ගබඩා කිරීමේ පහසුකම්, විද්‍යාගාර සහ අනෙකුත් අවශ්‍ය ගොඩනැගිලි ඇතුලු යටිතල පහසුකම් ස්ථාපනයට සහ පවත්වාගෙන යාමට ඇති කැමැත්ත.

06). නිශ්පාදන විවිධාංගීකරණය කිරීම, නිශ්පාදනයේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණය, උපකරණ/ කොටස් සහ හෝ යන්ත්‍ර සූත්‍ර අලුතින් එකතු කිරීමට ඇති කැමැත්ත.

07). ධීවර අමාත්‍යාංශය, නාරා ආයතනය සහ ව්‍යාපෘති යෝජිත ආයතනය යන ආයතන නියෝජනය කරමින් පත්වන ත්‍රිපුද්ගල කමිටුවකින් සමන්විත ව්‍යාපෘති කළමනාකරණ කමිටුවේ (Project Management Committee (PMC)) මඟපෙන්වීම යටතේ අභිජනනාගාරය ක්‍රියාත්මක කිරීමට සහ පවත්වාගෙන යාමට ඇති කැමැත්ත.

08). අභිජනනාගාරයේ කටයුතු ඕනෑම මොහොතක නාරා ආයතනය සහ ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA) හට අධීක්ෂණය කිරීම සඳහා ඉඩ ලබා දීමට ඇති කැමැත්ත.

9). ජාතික අවශ්‍යතාවයන්ට අදාළව ජලජීවී වගා ක්ෂේත්‍රයේ පර්යේෂණ කටයුතු මෙන්ම ව්‍යාපෘති යෝජිත ආයතනයේ පර්යේෂණ අවශ්‍යතාවයන්ද ඉටු කිරීම සඳහා අභිජනනාගාර පරිශ්‍රය තුළ නාරා ආයතනය සඳහා වෙනමම පර්යේෂණ පහසුකම් (R&D Facility) සකස් කර දීමට ඇති කැමැත්ත.

10). ව්‍යාපෘති යෝජිත ආයතනය විසින්ද ස්වකීය පර්යේෂණ සහ නිරෝධායන කටයුතු වෙනුවෙන් වෙනමම පර්යේෂණ සහ සංවර්ධන ඒකකයක් (R&D Unit)ස්ථාපනය කර පවත්වාගෙන යාමට ඇති කැමැත්ත.

11). තර්ජනයට ලක්ව ඇති ජලජ ජීවීන්ගේ ස්වාභාවික ගහණය වැඩි කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ කමිටුව මඟින් යෝජනා කරනු ලබන, අභිජනනාගාරය තුල නිපදවන කරදිය ජලජීවී විශේෂ වලින් යම් ප්‍රතිශතයක් ස්වාභාවික පරිසරයට මුදාහැරීමට ඇති කැමැත්ත.

12). යෝජිත පරිශ්‍රය යොදා ගනිමින් ජලජීවී වගාව පාදක කරගත් සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට ඇති කැමැත්ත.

13). ගිවිසුම අත්සන් කිරීමට පෙර ඕනෑම වෙලාවක ගිවිසුම එහි කොටසක් පිළිගනීම /ප්‍රතික්ෂේප කිරීම සඳහා සම්පූර්ණ බලය නාරා ආයතනය සතුව පවතී.

14). අභිලාෂයන් සැකසීම සහ ඉදිරිපත් කිරීමට යන සියළුම වියදම් එය ඉදිරිපත් කරන ආයතන/පුද්ගලයන් විසින් දැරිය යුතු වේ.

මේ සඳහා උනන්දුවක් දක්වන, සුදුසුකම්ලත් ආයතන නියෝජිතයන්හට තම අභිලාෂය 2022 නොවැම්බර් 01 දින සිට නොවැම්බර් 29 දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 02.00 හෝ ඊට පෙර සභාපති, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය, කාක දූපත, මට්ටක්කුලිය, කොළඹ 15 යන ලිපිනයට තැපැල් කර හෝ ගෙනවිත් භාර දිය හැක. (ටෙන්ඩර් පෙට්ටි අංක 01, මුදල් අංශය). ලිපි කවරයේ ඉහළ වම්පස කෙළවරෙහි " **සමුද්‍රීය බහු මත්ස්‍ය විශේෂ (Multi-species) ජලජීවී වගාව සඳහා අභිජනනාගාරයක් ස්ථාපිත කිරීම, නඩත්තු කිරීම සහ ක්‍රියාත්මක කරවීම කල්පිටිය - ටෙන්ඩර් පෙට්ටි අංක 01**" යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය.

මෙම ව්‍යාපෘතිය සඳහා ඉදිරිපත් වන අභිලාෂයන් විධිමත් ඇගයීමකින් පසු වඩාත් සුදුසු ව්‍යවසායකයින්ගෙන් නාරා ආයතනය විසින් නිකුත් කරනු ලබන කාර්යය පැවරුම් සංග්‍රහය (TOR) අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණික සහ මූල්‍ය යෝජනා (RFP) කැඳවනු ඇත. තාක්ෂණික සහ මූල්‍ය යෝජනා වෙන් වෙන් වශයෙන් ඇගයීමෙන් පසු සුදුසු ව්‍යවසායකයෙකු තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

වැඩි විස්තර ආචාර්ය පී. පී. එම්. හීනටිගල මිය අංශ ප්‍රධානි, අභ්‍යන්තර ජලජීවී වගා අංශය අමතා ලබාගත හැක.

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
නාරා ආයතනය,
කාක දූපත, මට්ටක්කුලිය,
කොළඹ 15
දු.ක: 011-2521717
ෆැක්ස්: 0112 – 521932
විද්‍යුත් තැපැල: purchasing@nara.ac.lk

ආචාර්ය පී. පී. එම්. හීනටිගල මිය,
අංශ ප්‍රධානි, අභ්‍යන්තර ජලජීවී වගා අංශය
නාරා ආයතනය,
කාක දූපත, මට්ටක්කුලිය,
කොළඹ 15
දු.ක 071 8569783, 011 2521005
විද්‍යුත් තැපැල: prajani15@hotmail.com

28.10.2022